සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - කොළඹ අධ්‍යාපන කලාපය
மேல் மாகாணக் கல்வித் திணைக்களம் - கொழும்பு கல்வி வலயம்
Western Provincial Education Department - Colombo Educational Zone

දෙවන වාර ඇගයීම -2016
இரண்டாம் தவணை மதிப்பீடு - 2016
Second Term Evaluation -2016

| 11 ශ්‍රේණිය<br>தரம் 11<br>Grade 11 | සිංහල සාහිත්‍යය රසාස්වාදය<br>சிங்கள இலக்கியநயம்<br>Sinhala Literary appreciation | පැය තුනයි<br>மூன்று மணித்தியாலங்கள்<br>Three Hours |
|---|---|---|

I කොටසෙහි 1,2 ප්‍රශ්නවලටත්, II කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, III කොටසෙහි 4,5,6,7 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු ලියන්න.

## I කොටස

1. (i) සිට (v) දක්වා ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ),(ආ) ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) 'මු යන්ට අවසර නොලද්දු නම් ළය පැළී මිය යන්නාහ. වන්නාට දැනට යෙත්ව'
   (අ) මෙහි 'මු' යන්නෙන් හඳුන්වන්නේ කවරෙක් ද?
   (ආ) මෙහි යාමට අවසර ඉල්ලන්නේ කොතනට ද?

(ii) "රු දු රු ගිනි කඳක් ගත් සඳෙහි වන'තුරු
   මි තු රු වේ ය දිගතින් හමන මඳ මරු
   ............................................................
   ............................................................"
   (අ) මෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
   (ආ) මෙම කවිය සඳහා යොදාගෙන ඇති ආකෘතිය කුමක් ද?

(iii) (අ) මහගම සේකරයන්ගේ කාව්‍ය සංග්‍රහ දෙකක් නම් කරන්න.
   (ආ) ඔහුගේ කාව්‍ය නිර්මාණ අතරින් අග්‍රඵලය ලෙස සැලකෙන්නේ කුමක් ද?

(iv) (අ) නිසඳැස් පද්‍ය සාහිත්‍යය සිංහල කාව්‍ය ක්ෂේත්‍රයට හඳුන්වා දුන් කවියා කවුද?
   (ආ) කොළඹ යුගයේ කවියේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.

(v) 'කටේ හැටි, කිරි අප්පුගෙ හොඹු කට වගෙයි '
   (අ) මෙයින් පැවසෙන්නේ කවුරුන් ගැනද?
   (ආ) මෙහි උපමාව වෙන් කොට දක්වන්න.

(ලකුණු 4 x 5 = 20)

2. පහත දී ඇති කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න

ගන්කුන තුලානේ අලියා වටුණ වැ    වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො    වේ
තුන්ලාහයකම බිම වැඩකර දියෙන් වැ    වේ
රත් වත් කරල් බරවී දැන් බීමට නැ    වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු    වර
තවමත් සිතේ ඇත අමතක නොවන    යුර
ඉන්නට ගොසින් ගෙන් හුවක් තරම    දුර
එනවා දිටිමි මිටි බැඳ ගෙන වියළි    දර

දරටික තබා සෙවණැති පලු ගසක    යට
පිස දම දමා දාඩිය එන නළල    පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ    කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර    මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි    විසින්
මගේ තොරතුරු ඇසූ හැටි හිතවතකු    ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙම්දුල කැඹිලි    ගසින්
පිළිගැන්වීය මට සොම්නස පිරුණු    ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි    වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව    ඇත්තේ
කෙලෙස ද කියා කළ ගුණ සැලකිය    යුත්තේ
දුන් සත පණහවත් ඔහු නැත පිළි    ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු    නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය    සිතී
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය    තුති
සිහිවී මගේ කම්මුල රතු පැහැය    ගතී

(ලකුණු 25 යි)

(i) මෙම පැදි පෙළ තුළින් ගැමි ජීවිතයේ අව්‍යාජත්වය විස්තර වන්නේ කෙසේ ද?

(ii) මේ සඳහා යොදාගත් ගැමිවහර පද්‍ය පන්තියේ තේමාවට ගළපාගෙන ඇත්තේ කෙසේ ද?

(iii) චිත්ත රූප මැවෙන ආකාරයට බස හසුරුවා ඇත්තේ කෙසේද?

(iv) සුන්දරහාමි,ආගන්තුකයා දුටු විට හැසිරුණ ආකාරය විස්තර කරන්න.

(v) ගැමියා මුදල් උදෙසා කිසිවක් නොකරන බව පසක් වන ආකාරය පැහැදිලි කරන්න.

## II කොටස

3. පහත දැක්වෙන ගද්‍ය, පද්‍ය කොටස් දෙකින් එක කොටසකට පමණක් උත්තර සපයන්න.

ජයසිංහ මහතා උඩුගම්පල පළාතේ කෙනෙකි. ඔහු රදාවානට පත්වී ආවේ ට්‍රෙනිං කොලීජියෙන් පිට වූ හැටියේමය. ඔහුට පෙර ඉස්කෝලේ ට්‍රෙනිං ගුරුවරයකුට හිටියේ ලොකු ඉස්කෝල මහත්තයා පමණකි. අනිත් අය අවසාන ගුරුවරුය. එසේ නැත්නම් මොනිටර්ලාය. ජයසිංහ මහතා කතාවෙනුත් සිනාවෙනුත් කාගේත් සිත් ගනී. දුටුවන් ඇලුම් කරවන සුලුය. අනිත් ගුරුවරුන් මෙන් රෙදි කෝට් නොව සුදු වේට්ටියකුත් ජාතික බැනියමකුත් ඇඳ උතුරු සළුවක් කරේ දමයි. ඉස්කෝල ගොඩනැගිල්ලේ එහා කෙළවරේ කාමරයෙහි පදිංචි වී සිටී. හන්දියේ සයිමන් මුදලාලිගේ ගෙදරින් රෑට දවාලට කෑම ගෙන්වා ගෙන කයි.

පත්වී ඇවිත් මාසයකින් දෙකකින් ඔහු ඉස්කෝලයේ මෙන්ම ගමේ ද එකසේ ජනප්‍රිය විය. කවුරුන් මුණ ගැසුනත් සුහද ලීලාවෙන් කතා කරයි. 'ආයුබෝවන් බුරම්පි අයියෙ, කොහොමද සැප දුක්', 'සේතං මුදලාලි බැරක් යනව වගෙයි.'

ජයසිංහ මහතා නිසා ඉස්කෝලය කළඑළි විය. ඔහු ඉස්කෝලයට එන මඟ දෙපස වලස් ඇඳිරිය වැට වටේටම කප්පාදු කොට අලංකාර කරවිය. විවිධ හැඩතලවලට ගඩොලින් මල් පාත්ති සාදවා මල් සිටුවීය. ඉස්කෝලයට හැරෙන තැන පාර අයිනේ ලොකු බෝඩ් ලෑල්ලක් සවි කරවිය. 'රදාවාන රජයේ පිරිමි පාසැල', යනුවෙන් ලොකු අකුරින් එහි ලියන ලදී. උත්සව දිනවලට ජාතික කොඩිය එසවීමට කොඩි ගසක් ද ඒ අසලින්ම සිටුවන ලදී. ජ්‍යෙෂ්ඨ පංතියේ ළමයින් ලවා ගමේ ආකෘතියක් ඊට පසු ඔහු පාසැල් වත්තේ සෑදවිය. සිමෙන්තියෙන් සාදන ලද මෙම ආකෘතිය හතරැස් අඩි තුන්සියක් පමණ විශාලය. ගමේ කඳු- හෙල්-ඇළි- දොළි මංවාවත් ආදී වැදගත් දේ සියල්ල මෙහි ලකුණු කරන ලදී. ආකෘතියේ තීන්ත ගෑම ජයසිංහ මහතා විසින් පවරන ලද්දේ මටය. ගොඩ බිමට තද කොළ පාට. කුඹුරුවලට ළා කොළ පාට. ඇළි නිල් පාටින්. පාරවල් සුදු පාටින්.

(i) මෙම ගද්‍ය කොටසෙහි ඇතුළත් වන ප්‍රධාන කරුණු වාක්‍ය දෙකකින් පමණ ලියන්න. (ලකුණු 04 යි)

(ii) මෙහි සඳහන් ආකාරයට ජයසිංහ මහතා පාසැලේ දියුණුව උදෙසා කටයුතු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ජයසිංහ මහතා ගමේ ජනප්‍රිය පුද්ගලයෙක් බවට පත්වීමට හේතු පිළිබඳ කරුණු දෙකක් ගෙනහැර පාමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 07 යි)

(iv) මෙහි ඇතුළත් ගැමි වහර කීපයක් තෝරාගෙන ඒ පිළිබඳ කෙටි විග්‍රහයක් කරන්න. (ලකුණු 08 යි)

## නැකතොත්

උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදයකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අප හට තරම් නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග මි මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො මි සිදුරක තරම්වත් අඩ දබර නොලා
පි මි මක් පනිමු ගම්මුන්ගේ ජය ම . බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

(i) මෙම කවි පන්තියෙහි වස්තු විෂය පේළි දෙකකින් පමණ විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) මෙහි දෙවන පද්‍යයේ අදහස කෙටියෙන් ලියන්න. (ලකුණු 06 යි)

(iii) මෙයින් පැවසෙන ආකාරයට ඉටුවිය යුතුකම පිළිබඳ කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 07 යි)

(iv) "මෙම පැදි පෙළ යුගයේ සමාජ අවශ්‍යතාවක් පිළිබඳ විග්‍රහ කරයි" ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 08 යි)

(ලකුණු 25 යි)

The National e-learning Portal for The General Education

## III කොටස

මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

4. 'කුස ජාතකයේ භාෂාව හසුරුවා ඇත්තේ චිත්ත රූප මැවෙන අයුරිනි ' නිදසුන් තුනක් දෙමින් පැහැදිලි කරන්න.

5. 'තුංමංහංදිය' යනු ගැමි දිවිය ඇසුරුකර ගනිමින් රචිත නව කතාවකි'. උදාහරණ තුනක් දෙමින් විමසන්න.

6. 'අලගියවන්න මුකවෙටිතුමා උපදේශ පැහැදිලි කිරීම සඳහා ස්වභාවික පරිසරයේ යම් යම් අවස්ථා යොදාගෙන ඇත.' නිදසුන් තුනක් දෙමින් මෙම අදහස විග්‍රහ කරන්න.

7. 'උතුරෙන් ' පැදි පෙළ කාලීන වටිනාකමින් යුතු නිර්මාණයකි. ඔබේ අදහස් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15X2 = 30 යි)